ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனம்
CEYLON PETROLEUM CORPORATION

CEYPETCO
ENERGIZING THE FUTURE

# මාධ්‍ය නිවේදනයයි.

2026 අප්‍රේල් මස 16 වන දින.

ප්‍රධාන කර්තෘ/ප්‍රවෘත්ති කර්තෘ,
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/කළමනාකාර (ප්‍රවෘත්ති)/ප්‍රවෘත්ති සංස්කාරක,

මහත්මයාණෙනි/මහත්මියෙණි,

## **"ශ්‍රී ලංකාව බොරතෙල් බැරලයකට ඇමරිකානු ඩොලර් 286ක අධික මිලක් ගෙවලා" යන සාවද්‍ය ප්‍රවෘත්තිය සම්බන්ධයෙන් කෙරෙන නිවැරදි කිරීම.**

ශ්‍රී ලංකාවට බොරතෙල් ගෙනෙනු ලබන්නේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සපුගස්කන්ද පිරිපහදුව සඳහා පමණි. මැදපෙරදිග කලාපයේ නොසන්සුන්තාව ඇතිවීමෙන් පසුව ලංකාව වෙත ලඟාවෙන ප්‍රථම බොරතෙල් නවුකාව හෙටදිනයේ එනම් 17 දින ලංකාවට ලඟාවේ. ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් ගෙන්වනු ලැබූ හෝ ගෙන්වීමට ගිවිසුම්ගත වූ කිසිදු බොරතෙල් තොගයක, බැරලයක් සදහා ඇමරිකානු ඩොලර් 286 ගෙවා හෝ ගෙවීමට පොරොන්දු වී නොමැත. මැදපෙරදිග යුද්ධය හටගැනීමෙන් පසු පැමිණෙන බොරතෙල් නවුකා සඳහා දලවශයෙන් බැරලයකට ඇමරිකානු ඩොලර් 71.99, 111.62, 71.81 හා 113.29 ලෙස ගෙවීමට පොරොන්දුවී ඇති අතර, එය දැනට වෙළදපලේ ඇති මිලට සාපේක්ෂව ඉතා වාසිදායක අගයක් වේ. ඒ අනුව ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව අනෙක් තරගකාරී සමාගම් වලට සාපේක්ෂව ඉතා සාධනීය හා වාසිදායක තත්වයක් උදාකරගෙන ඇති අවස්ථාවක, සංස්ථාවේ කීර්තිනාමය විනාශකිරීමේ අරමුණෙන් කෙරෙන සාවද්‍ය ප්‍රකාශ තරයේ හෙලාදකිමු. එසේම මෙවන් සාවද්‍ය ප්‍රකාශ සමාජගතකොට , ජන සමාජය නොසන්සුන් කිරීම , ආතතියට පත්කිරීම හා ලංකා ඛනිජ තෙල් නිතිගත සංස්ථාවේ කීර්තිනාමය විනාශකිරීම සම්බන්ධයෙන් සියලුම පාර්ශව වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනිමට බලාපොරොත්තු වෙමු.

ස්තූතියි,

සභාපති, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
අංක : 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ - 09.
දුරකථන අංක : 0117-296248, 0117-296130 ෆැක්ස් : 0112-106770
වීඑස්/එල්ඩීඑන්.